පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :79

ආයතනයේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය : රත්නපුර

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 79

நிறுவனத்தின் பெயர்: மாவட்ட செயலகம் இரத்தினபுரி

பாராளுமன்றத்தின் அரச கணக்குகள் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பான நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series Number : 79

Name of the Institution: District Secretariat : Ratnapura

Submissions of observations of the Hon Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119(4)

පාර්ලිමේන්තු මාලා අංක - 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර

<u>පළමු කොටස :91.00</u>

| රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම | ගණන් දීමේ නිළධාරී විසින් ගත් ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය |
|---|---|
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | 2023 වර්ෂයේ මෙය නිවැරදි කර ඇති අතර එම වර්ෂයේ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් විමසනු ලැබූ ප්‍රශ්නාවලියෙහි මෙය සඳහා අදාළ මුළු ලකුණු ප්‍රමාණය ලැබී ඇත. මේ වන විට සියලුම විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දී ඇත. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | 2023 වර්ෂයේ මෙය නිවැරදි කර ඇත. දැනට අභ්‍යන්තර විගණන විමසුම් ලැබුණු විගස පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

<u>දෙවැනි කොටස:87.00</u>

| රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම | ගණන් දීමේ නිළධාරී විසින් ගත් ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය |
|---|---|
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2023 වර්ෂය වන විට මෙය නිවැරදි කර ඇත.ඒ අනුව මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා අදාළ ලකුණු ප්‍රමාණය ලබා ඇත. |
| දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පැවැත්වීම සඳහා පියවර ගෙන ඇති අතර 2023 වර්ෂයේ සිට ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වාගෙන යනු ලැබේ. |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | 2023 වර්ෂයේ සිට මෙය නිවැරදි කර ඇති අතර එම වර්ෂයේ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් විමසනු ලැබූ ප්‍රශ්නාවලියෙහි මෙය සඳහා අදාළ මුළු ලකුණු ප්‍රමාණය ලැබී ඇත. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට සමගාමීව දිස්ත්‍රික් විශේෂ පොහොර සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීමට උපදෙස් ලබා දී ඇති අතර 2023 වර්ෂයේ සිට සෑම මසකම කමිටු පවත්වා මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් විමසනු ලැබූ ප්‍රශ්නාවලියෙහි මෙය සඳහා අදාළ මුළු ලකුණු ප්‍රමාණය ලැබී ඇත. |
| දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටුව මාසිකව පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර 2023 වර්ෂයට අදාළව මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් විමසනු ලැබූ ප්‍රශ්නාවලියෙහි මෙය සඳහා මුළු ලකුණු ප්‍රමාණය ලැබී ඇත. |
| හදුනාගත් නිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි . | මාර්ගගත තොරතුරු කළමනාකරණ ප්‍රශ්නාවලියෙහි දර්ශක නැත යන්න සඳහන් කර තිබුණද 2022 හා 2023 වර්ෂයන්හි වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි දර්ශක සඳහන් කර ඇත. |

| | |
|---|---|
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය . | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය 2022 හා 2023 වර්ෂයන්හි යටත්ව මට්ටමේ මතයක් ලෙස ලබා දී ඇත. |
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් රැස්වී නොතිබුණි . | 2023 වර්ෂයේ සිට මේ දක්වා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් නියමිත කාලයට පවත්වා ඇත. |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වී නොතිබුණි . | 2023 වර්ෂයේ කාර්තුවකට 01 බැගින් කමිටු 04 ක් පවත්වා ඇති අතර 2024 වර්ෂයේ මේ වන විට කමිටු 02 ක් පවත්වා ඇත. 2023 වර්ෂයේ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් විමසනු ලැබූ ප්‍රශ්නාවලියෙහි මෙය සඳහා අදාළ මුළු ලකුණු ප්‍රමාණය ලැබී ඇත. |
| සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | මේ වන විට ZOOM තාක්ෂණය භාවිතයෙන් හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පුහුණු අවස්ථා පවත්වනු ලබයි. |
| දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්වී නොතිබුණි | 2023 වර්ෂයේ සිට මෙය නිවැරදි කර ඇති අතර එම වර්ෂයේ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් විමසනු ලැබූ ප්‍රශ්නාවලියෙහි මෙය සඳහා අදාළ මුළු ලකුණු ප්‍රමාණය ලැබී ඇත. |

.....

වසන්ත ගුණරත්න,

දිස්ත්‍රික් ලේකම් / දිසාපති,

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය.

වසන්ත ගුණරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
රත්නපුර.

.....

එස්.පී.චන්ද්‍රපාල,

ප්‍රධාන ගණකාධිකාරී,

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය.

එස්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරී
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් අපේක්ෂිත අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## අමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය